# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2097/9 - 2018 නොවැම්බර් මස 12 වැනි සඳුදා - 2018.11.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ගාල්ල මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ කාරියවසම් තෙලිකඩ ගමගේ තිසර අමරතුංග අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කීර්ති කුමාර සෙනෙවිරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ගාල්ල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි ජයසිංහ ආරච්චිල්ලාගේ සමන්ත ප්‍රියලීල් ජයසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කීර්ති කුමාර සෙනෙවිරත්න, ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ජේ. ඒ. එස්. පී. ජයසිංහ,
තේරීම්භාර නිලධාරී,
ගාල්ල මහ නගර සභාව.

2018 නොවැම්බර් මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

11 - 1150


1A - G 28944 — 17 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*